# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
## இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
## HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2025.08.05


එච්.ඩී.කේ.එස්. පෙරේරා මයා,
අංක : 273/2,
හිඹුටාන පටුමග,
අංගොඩ.

පැමිණිලිකරු

1) ෂේමාල් ප්‍රනාන්දු මයා
අධ්‍යක්ෂ ජනරාල් (හිටපු)
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව,
අංක :9, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

2) උදාර ලියන්වල මයා
ලේකම්
ජාතික ජිම්නාස්ටික් සංගමය
510/ඒ, ගනේ පාර, රාගම

3) ලේකම්
තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය
කොළඹ 07

වගඋත්තරකරුවන්


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.

සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451

ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74

ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com

දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82

ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521

ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996

වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

**පැමිණිලි අංකය : HRC/07/24**

**පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන ලද කරුණු**

පැමිණිලිකරු වන එච්.ඩී.කේ.එස්.පෙරේරා යන අය විසින් 2024.01.01 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් දක්වා සිටින්නේ 2023.05.29 වන දින පැවැත් වූ ජාතික ජිම්නාස්ටික් සංගමයේ නිලවරණය සඳහා තමා විසින් සභාපති/ලේකම් තනතුරු සඳහා අයදුම්පත ඉදිරිපත් කළ අවස්ථාවේ එම ඉල්ලුම් පත්‍රය නිලවරණ කමිටුව විසින්ද පිළිගෙන තිබූ අවස්ථාවක අභියාචනා උපදේශක කමිටුව විසින් අසත්‍ය වාර්තා පදනම් කරගෙන තම අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කර නිලවරණ කමිටුවෙන්ද ප්‍රතික්ෂේපව සිටි උදාර ලියන්වල යන අයගේ අයදුම්පත්‍රය සුදුසු අයදුම්පතක් ලෙස භාර ගැනීමට නිලවරණ කමිටුව වෙත නියෝග කර තමාට අසාධාරණයක් සිදු කර ඇති බවය. තමා සංගමයේ සිටි කාලය තුළ තම භාරයේ පැවති ජිම්නාසිටික් සංගමයට අයත් භාණ්ඩ හතරක් භාර දී නොතිබීම සම්බන්ධව තිබූ විරෝධතාවයක් පදනම් කරගනිමින් නිලවරණයට අදාළව තමා ඉදිරිපත් කළ අයදුම්පත එලෙස ප්‍රතික්ෂේප කර තිබූ බවය. ඒ අනුව සභාපති/ලේකම් තනතුරු සඳහා ඉදිරිපත් කළ අයදුම්පත ප්‍රතික්ෂේපකර තිබීමට එරෙහිව තමා විසින් සිදු කළ අභියාචනය නිලවරණ කමිටුව විසින් නොසලකාහැර ඇති බවටද පැමිණිල්ලෙන් කරුණු දක්වා ඇත.

පැමිණිලිකරු තවදුරටත් කියාසිටින්නේ තමා ශ්‍රී ලංකා ජිම්නාස්ටික් සංගමයේ සභාපති ධූරයට සුදුසකම් සපුරා ඇති බව සඳහන් වාර්තාව 2023.04.27 වන දිනම තමා වෙත ලද බවටත් එහි නිලවරණය පවතින දිනය වශයෙන් 2023.05.29 දිනය සඳහන් කර තිබූ බැවින් සෙසු සාමාජිකයින් සමඟ නිලවරණය සඳහා සූදානම්ව සිටි බවයි. ඒ අතරතුර ක්‍රීඩා පනත උල්ලංඝනය කරමින් 2023 වර්ෂයේ ජාතික ජිමනාසටික් නිලවරණය සඳහා තමා නුසුදුස්සෙකු වන බවට ක්‍රීඩා අමාත්‍යවරයා වෙත විරෝධතාවයක් ඉදිරිපත් කර තිබූ බව දැනගන්නා ලද බවය. එම විරෝධතා පැමිණිල්ල විභාගයට ගැනීමට 2023.05.16 දින නියමිත බව සඳහන් කරමින් 2023.05.10 වන දින ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ අභියාචනා උපදෙශන කමිටුවේ ලේකම්වරිය වන ශලිනි රෝෂානා ප්‍රනාන්දු යන අය විසින් තමා වෙත නොතීසියක් යොමු කරන ලද බවත් පසුව තමා ඒ සමබන්ධයෙන් පරීක්ෂා කිරීමේදී එම විරෝධතාවය උදාර ලියන්වල යන අය විසින් 2023.05.04 දින යොමු කර ඇති බව තමා හට නිරීක්ෂණය වූ බවටත් පැමිණිලිකරු විසින් කරුණු ඉදිරිපත් කර ඇත. ඒ අනුව ශ්‍රී ලංකා ජිම්නාස්ටික් සම්මේලන නිලවරණ කමිටුව විසින් නිලවරණ පැවැත්වීමේ ක්‍රියාවලිය පිළිබඳව ලබා දුන් කාල සටහන ප්‍රකාරව විරෝධතා දැක්වීමේ අවසන් දිනය 2023.04.19 ලෙසත් දිනත් විරෝධතා පරීක්ෂා කර ලේඛන යොමු කිරීමේ දිනය 2012.4.27 ලෙසත් පැහැදිලිව සඳහන්කර තිබියදී අභියාචනා උපදේශන කමිටුව විසින් 2023.05.10 දින මෙලෙස නීතියට පටහැනිව විරෝධතා භාර ගැනීම සිදු කර ඇති බවට වැඩිදුරටත් දක්වා තිබේ.

පසුව අභියාචනා උපදේශන කමිටුව විසින් විරෝධතා පරීක්ෂා කිරීම සඳහා පැමිණීමට දන්වා සිටි දිනය වන 2023.05.17 වන දින තමා ඒ සඳහා සහභාගී වූ බවත් එහිදී තමා විසින් මෙම විරෝධතා දැක්වීමේ කාලසීමාවට පටහැනිව විරෝධතාවය භාර ගැනීම නීති විරෝධී බවට කරුණු දක්වා සිටියද අභියාචනා උපදේශන කමිටුව විසින් දක්වා සිටියේ ඒ සම්බන්ධයෙන් නිලවරණ කමිටුව විසින් ක්‍රියා කළ යුතු බවත් අභියාචන මණ්ඩලය වෙත යොමු කරන ලද අභියාචන සම්බන්ධයෙන් පමණක් අභියාචනා උපදේශන කමිටුව විසින් කටයුතු කරන බවත්ය යන්නයි. ඒ අනුව තමාගේ කරුණු හා විරෝධතා සම්බන්ධයෙන් කිසිදු සටහනක් සටහන් කර නොගන්නා ලද බවත් උදාර ලියන්වල යන අය ඉදිරිපත් කරන ලද විරෝධතා කරුණු සම්බන්ධයෙන් පමණක් විභාගයට ගන්නා ලද බවටත්

කොමිෂන් සභාව හමුවේ කරුණු ඉදිරිපත් කර ඇත. මෙහිදී පැහැදිලිව අභියාචන උපදේශන කමිටුව අනෙක් පාර්ශවයට පක්ෂපාතීව එම අවස්ථාවේදී ක්‍රියා කළ බවත් තමා හට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා නොදෙන ලද බවටද කරුණු දක්වා ඇත. තමාට එරෙහිව උදාරලියන්වල නමැති අය විසින් විරෝධතා පත්‍රිකාවේ සඳහන් කර තිබුණේ 2023 වර්ෂයේ ජාතික ජිම්නාස්ටික් නිලවරණය සඳහා ඉදිරිපත් වී ඇති තමා (පැමිණිලිකරු) ජාතික ජිම්නාස්ටික් සංගමයේ සභාපතිවරයා වශයෙන් සිට නිල කාලසීමාව අවසානයේ තනතුරු හැර යන අවස්ථාවේදී ක්‍රීඩා පනත ප්‍රකාරව ස්ථාවර වත්කම් අදාළ නිලධාරී මණ්ඩලය වෙත භාර නොදීම හේතුවෙන් නිලවරණය සඳහා නුසුදුස්සෙකු වන බවට බවයි.

තමා සභාපති වශයෙන් කටයුතු මෙහෙය වූ කාලය තුළ ( 2018/2019) තමා විසින් ස්ථාවර වත්කම් බාර ගැනීමක් සිදුකර නොමැති බවත් තමා සිටි කාලයේ ගිණුම් වාර්තා වලට අනුව Valuing Table, Laptop Computer 01, Laser Printer 01, Photocopy Machine යන උපකරණ විගණන වාර්තාවේ ස්ථාවර වත්කම් ලෙස සඳහන් වූ බවත් එම ගිණුම් වාර්තාව සභාපති/ලේකම් ලෙස අත්සන් කර ඇති මුත් තමා කිසිදු වත්කමක් ලිඛිතව බාරගැනීමක් සිදුකර නොමැති බවත් තමාගෙන් පසුව 2020 සහ 2021 වර්ෂ වල ජිම්නාස්ටික් සංගමයේ සභාපති/ලේකම්ද එලෙසම එම ස්ථාවර වත්කම් බාරගෙන ඇති බැවින් මෙම ස්ථාවර වත්කම් ගිණුම් වාර්තාවලට අනුව ක්ෂය වීම 50% සහ20% ආකාරයෙන් පමණක් සඳහන්ව ඇති බවයි. ඒ අනුව මෙම චෝදනාව පැහැදිලිවම පදනම් විරහිත බවත් එමෙන්ම 2020, 2021 සහ 2022 වර්ෂ වල විගණන වාර්තා වලට වර්තමානයේ අනීතික ලෙස ජිම්නාස්ටික් සංගමයේ ලේකම් ධූරය දරන තමා වෙත අසත්‍ය චෝදනා එල්ල කරන ලද උදාර ලියන්වල තැනැත්තා යන අයද අත්සන් කර ඇති බවටත් පැමිණිලිකරු විසින් කොමිසම වෙත කරුණු දක්වා ඇත.

එම චෝදනාව තමා වෙත එල්ල කරන ලද පදනම් විරහිත චෝදනාවක් බවත් ජාතික ජිම්නාස්ටික් සංගමයේ කිසිදු දේපලක් සම්බනධයෙන් කිසිදු තොග ලේඛනයක් ඒ වන විට ජාතික ජිම්නාසටික් සංගමයට නොතිබූ අවස්ථාවක ක්‍රීඩා පනතට හෝ ක්‍රීඩාව වෙනුවෙන් නිකුත් කරන ලද ගැසට් පත්‍රයට හෝ ජිමනාස්ටික් සංගමයේ ව්‍යවස්ථාවට අදාල නොමැති හුදු පදනම් විරහිත වාර්තාවක් එලෙස තමාට විරුද්ධව යොමු කර ජාතික ජිමනාස්ටික් සංගමයේ සභාපති හා ලේකම් තනතුරු සඳහා ඉදිරිපත් වීමට එය නුදුසුකමක් ලෙස වාර්තා කර නිලවරණයට ඉදිරිපත් වීමට තිබූ අවස්ථාව අහිමි කිරීම හා අහිමි කර ඇති හෙයින් තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට කරුණු දක්වමින් මීලඟ නිලවරණය සඳහා ඉදිරිපත්වීමට බාධාවක් නොමැති බවට තහවුරු කර ගැනීම සඳහා සාධාරණ පරීක්ෂණයක් සිදු කරන ලෙස පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙතින් ඉල්ලා ඇත.

<u>වගඋත්තරකරුගේ කරුණු දැක්වීම</u>

1 වන වගඋත්තරකරු විසින් යොමු කරන ලද 2024.03.26 දිනැති වාර්තාව මඟින් කොමිෂන් සභාව වෙත කරුණු දක්වා ඇත්තේ 1973 අංක 25 දරණ ක්‍රීඩා පනතේ 32 හා 33 වැනි වගන්තිය අනුව ක්‍රීඩා අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අංක 2320/59 දරණ 2023.02.22 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් නිකුත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ශ්‍රී ලංකා ජිමනාස්ටික් සංගමයේ ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවා ඇති බවත්, තාවකාලික කාර්ය ක්‍රමයක් යටතේ එකී සංගමයේ කටයුතු සිදු කරගෙන යාම සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා නිසි බලධරයා වශයෙන් පත් කර ඇති බවයි. ඒ අනුව ක්‍රීඩා සංවර්ධන

දෙපාර්තමේන්තුව මගින් පත් කල නිලවරණ කමිටුවක් මගින් ශ්‍රී ලංකා ජාතික ජිම්නාස්ටික් සංගමයේ නිලවරණය 2023.05.29 වන දින පැවැත්වීමට කටයුතු කර ඇති බවද දක්වා තිබේ.

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාතුමා විසින පත් කරන ලද අභියාවනා උපදේශක කමිටුව වෙත යොමු කරන ලද අභියාවනා පරීක්ෂා කිරීමෙන් පසු නිරීක්ෂණ සහ නිර්දේශ ඇතුලත් වාර්තාවක් අභියාවනා උපදේශක කමිටුව විසින් අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කරනු ලබන බවත් එම නිර්දේශ ඇතුලත් වාර්තාව අමාත්‍යතුමා විසින් අනුමත කිරීමෙන් අනතුරුව ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය මගින් එම අභියාවනා උපදේශක කමිටු වාර්තාවේ ඇතුළත් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා පමණක් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමු කරනු ලබන බවත් වැඩිදුරටත් එම වාර්තාවෙන් දක්වා තිබේ. ඒ අනුව අභියාවනා උපදේශක කමිටු වාර්තාවන්හි ඇතුලත් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අදාල පාර්ශවයන් වෙත දැනුවත් කිරීම පමණක් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන බව 1වන වගඋත්තරකරු විසින් වැඩිදුරටත් දක්වා ඇත.

<u>පරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු</u>

2024.10.16 දින මෙම කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණ අවස්ථාවේදී පැමිණිලි පාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද කරුණු අනුව පැමිණිලිකරු ජිම්නාස්ටික් සංගමයේ සභාපති ධුරයේ නිලවරණයට ඉදිරිපත් වූ අවස්ථාවේ තමා සන්තකයේ තිබූ ජිම්නාසිටික් සංගමයට අයත් භාණ්ඩ හතරක් භාර දී නොතිබීම සම්බන්ධයෙන් විරෝධතාවයක් ඉදිරිපත් කරමින් නිලවරණයට අදාළ තමාගේ අයදුම්පත ප්‍රතික්ෂේප කර තිබූ බවත් 2018 වර්ෂයේ වැඩ බලන සභාපති ලෙස තමා පත් වීම ලබා ගත් පසු මෙම භාණ්ඩ භාර ගැනීමක් නොකර ඇති බැවින් එකී තනතුරෙන් ඉවත් වන විට භාර නොගන්නා ලද එකී භාණ්ඩ නැවත භාරදීමේ අවශ්‍යතාවයක් නොවන බවට කරුණු දක්වන ලදී. තවද මේ වන විට එකී භාණ්ඩ කොළඹ විශාඛා විද්‍යාලයේ, කොළඹ ආනන්ද විද්‍යාලයේ හා ටොරින්ටන් ක්‍රීඩාගාරයේ ඇති බැවින් හා ඉන් පසුව පත් වූ සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන අය විසින් ඒවා භාරගත් බවට 2021 වර්ෂයේ අවසන් විගණන වාර්තාවේ පිළිගෙන අත්සන් තබා ඇති බැවින් අනාගතයේදී මේ සම්බන්ධව චෝදනාවකට ලක්විය හැකි බැවින් තමා ඉන් නිදහස් කර ඒ බව වාර්තා කරන ලෙස කොමිෂන් සභාව හමුවේ ඉල්ලා සිටින ලදී.

මේ වන විට එම භාණ්ඩ නිසි ලෙස භාර දී ඇතත් ඒ පිළිබද විධිමත් ලිපියක් නිකුත් නොකිරීම හේතුවෙන් තමාට නැවත නිලවරණයක් සඳහා අයදුම් කිරීමට ඇති අවස්ථාව අහිමි වී ඇති බවට කළ කරුණු දැක්වීම අනුව එදින 1 වගඋත්තරුකරු වෙනුවෙන් බලය පවරන ලද සහකාර අධ්‍යක්ෂ ඩබ්.එම්.එස්. කුමාර මහතා විසින් කොමිෂන් සභාව හමුවේ කරුණු දක්වා ඇත්තේ පැමිණිලිකරු විසින් ජාතික ජිම්නාස්ටික් සංගමයට අයත් භාණ්ඩ නිසි පරිදි භාර දී තිබේ නම් කොමිෂන් සභාව විසින් ඒ පිළිබඳ ලිඛිත ඉල්ලීමක් සිදු කරන්නේ නම් ඒ අනුව පවතින කරුණු පරීක්ෂා කර බලා ඉල්ලීම අනුව කටයුතු කිරීමට පියවර ගෙන කොමිෂන් සභාව වෙත වාර්තා කරන බවටය. එම එකඟතාවය අනුව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අමතන ලද මෙම කොමිෂන් සභාවේ 2024.10.30 දිනැති ලිපිය මගින් දන්වන ලද්දේ පරීක්ෂණ අවස්ථාවේ ඇති කර ගත් එකඟතාවය අනුව කටයුතු සිදු කර පැමිණිලිකරුගේ ඉල්ලීම සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන අදාළ ලිඛිත දැනුම් දීම පැමිණිලිකරුට ලබා දී ඒ පිළිබඳ කොමිෂන් සභාවට දන්වන ලෙසය. එම ලිපිය අනුව ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2024.11.06 දිනැති ලිපිය මගින් ජාතික ජිම්නාස්ටික් සංගමයේ සභාපති අමතා දන්වා ඇත්තේ පැමිණිලිකාර එච්.ඩී.කේ.එස්. පෙරේරා මහතා විසින් තමා සන්තකයේ තිබූ ජිම්නාස්ටික්

සංගමයට අයත් භාණ්ඩ/උපකරණ නිසි අයුරින් භාර දී තිබේද යන්න පිළිබඳ සහ එම භාණ්ඩ ජාතික ජිම්නාස්ටික් සංගමය විසින් භාරගත් බවට එච්.ඩී.කේ.එස්. පෙරේරා මහතා වෙත ලිඛිතව දැනුම් දී ඇත්නම් ඊට අදාළ ලිපි ලේඛන සමඟ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලෙසය. ඒ අනුව ඒ සම්බන්ධයෙන් පිළිතුරු දක්වමින් ජාතික ජිම්නාස්ටික් සංගමයේ ලේකම් උදාර එස්. ලියන්වල විසින් ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් අමතන ලද 2024.11.13 දිනැති ලිපිය මඟින් ජාතික ජිම්නාස්ටික් සංගමයේ හිටපු සභාපති වන පැමිණිලිකාර එච්.ඩී.එස්.කේ.පෙරේරා ජිම්නාස්ටික් සංගමය වෙත ලේඛන භාරදීම හා ස්ථාවර වත්කම් භාර දීම නොදීමට අදාළව පවතින කරුණු ඇතුළත් ලේඛන සහිත වාර්තාව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් මෙම කොමිෂන් සභාව වෙත යොමු කර ඇත. එම වාර්තාවේ සඳහන් ලේඛන අතර අංක 05 යටතේ **2020 ජනවාරි නිල කාල සීමාව නිම වන එච්.ඩී.කේ.එස්. පෙරේරා මහතා 2023 මාර්තු 10 පවත්වන නව ලේකම් කපිල ජීවන්ත මහතාට 2023.09.08 ලේඛන භාරදීම/** ස්ථාවර වත්කම් බාර දී නැත යනුවෙන් දක්වා ඇත.

කොමිෂන් සභාව ඉදිරියේ පැවති මුල් පරීක්ෂණ අවස්ථාවේදී පැමිණිල්ලට අදාළ ගැටලුව ආයතනික මට්ටමින් විසඳා ගැනීමට එකඟතාවය දක්වා ඇතත් එය ක්‍රියාත්මක නොවීම තුළ විශේෂයෙන්ම ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට පමණක් පැමිණිලිකරු ඔහු ජිම්නාස්ටික් සංගමයේ සභාපති වශයෙන් සේවය කළ අවස්ථාවෙන් පසු භාණ්ඩ භාර දී ඇති/නැති බවට ඒකමතිකව තීරණයක් ගැනීමට ඇති නොහැකියාව 2025.01.15 පැවති පරීක්ෂණ අවස්ථාවේදී ප්‍රකාශ වීමෙන් අනතුරුව ක්‍රීඩා අමාත්‍යාංයේ ලේකම්, ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් ෂේමාල් ප්‍රනාන්දු නමින් හා ජාතික ජිම්නාස්ටික් සංගමයේ ලේකම් උදාර ලියන්වල යන අයවලුන්ගේ නමින් සිතාසි නිකුත්කර 2025.02.05 දින කොමිෂන් සභාව හමුවට කැඳවා පරීක්ෂණය සිදු කරන ලදී.

එහිදී පැමිණිලිකරු කියා සිටියේ එවකට සිටි අමාත්‍යවරයා විසින් පත් කළ අභියාචන කමිටුවක් විසින් පැමිණිලිකරුගේ භාණ්ඩ භාර දීම සම්බන්ධව පරීක්ෂා කර බලා ලබා දුන් නිර්දේශය අනුව පැමිණිලිකරු නිලවරණයට ඉදිරිපත් වීමට නුසුදුස්සෙකු බව දක්වා ඇතත් පැමිණිලිකරුගේ අදහස වූයේ එය නිලවරණයකට නුසුදුස්සන් බවට ගැසට්ගත කරුණු අතරට නොවැටෙන බවයි. එහිදී වගඋත්තරකාර පාර්ශවය එහිදී කරුණු දක්වා ඇත්තේ තමාට එරෙහිව නිකුත් කළ අභියාචන කමිටු තීරණයට එරෙහිව අභියාචනයක් අමාත්‍යවරයාට සිදු කිරීමට හැකියාව තිබූ බවයි. එහිදී පැමිණිලිකරු විසින් කරුණු දක්වන ලද්දේ තමා සභාපති ධූරය සඳහා නුසුදුස්සෙකු බවට පත් කර තිබීමට එරෙහිව සිදු කළ අභියාචනයක් අමාත්‍යතුමා වෙත සිදු කළ නමුත් නිලවරණ කමිටුව විසින් එය නොසලකා හැරි බවයි. එම පරීක්ෂණ අවස්ථාවේදී ද ආයතනික මට්ටමින් සමථයක් වීම සුදුසු බව පෙන්වා දුන්නද එවැනි වූ එකඟතාවයකට පැමිණීමක් සිදු නොවූ අතර සියලු පාර්ශවයන් විසින් වාචික දේශන ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පෙනී යන ලද්දේ පැමිණිලිකරු විසින් භාර නොදුන් බවට කියා සිටින භාණ්ඩ වර්ග හතරක් මේ වන විට පැමිණිලිකරුගේ සභාපතිධූර කාලයෙන් අනතුරුව පත් වූ සංගම් හෝ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ විවිධ ස්ථාන වල පවතින බවයි. පැමිණිලිකරු භාරදිය යුතු බවට ප්‍රකාශ කරන භාණ්ඩ හෝ අභියාචනා කමිටුවේදී භාර නොදුන් බවට ප්‍රකාශිත උපකරණ මේ වන විට ක්‍රීඩා සංගමය විසින් සොයාගෙන පවතින බවට සංගමය විසින්ද කොමිසම හමුවේ ප්‍රකාශ කර ඇත.

ඉන් අනතුරුව පැමිණිල්ලට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සිදු කරන ලද පරීක්ෂණ කටයුතු අනුව 2025.04.04 දිනැති ලිපිය මඟින් තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යංශයේ ලේකම් හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අමතා විමසන ලද්දේ පැමිණිලිකරු විසින් තම පැමිණිල්ලේ දක්වා ඇති ආකාරයට අදාළ භාණ්ඩ හා උපකරණ මේ වන විට පැමිණිලිකරු විසින් භාර දී හෝ මේ වන විට ක්‍රීඩා සංගමය විසින් සන්තකයට ගෙන පවතීද? එසේ

නම් එකී භාණ්ඩ භාර දුන් හෝ සන්තකයට ගන්නා ලද බවට ප්‍රකාශිත දිනය කුමක්ද ? තවදුරටත් පැමිණිලිකරු භාර දිය යුතු භාණ්ඩ හෝ උපකරණ පවතීද ? යන්නයි. එයට පිළිතුරු වශයෙන් දක්වා ඇත්තේ මේ වන විට අදාළ භාණ්ඩ හා උපකරණ සංගමය සන්තකයේ පවතින බවත් අදාළ භාණ්ඩ හා උපකරණ 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ 3.2 හි (ඊ) කොටසේ සංගමය සතු ස්ථාවර වත්කම් යටතේ දක්වා ඇති බවත් තවදුරටත් පැමිණිලිකරු විසින් භාරදිය යුතු භාණ්ඩ හා උපකරණ නොමැති බවත්ය.

තවද පැමිණිලිකරු විසින් ක්‍රීඩා සංගමයේ සභාපති ධූරය සඳහා අයදුම් කර තිබිය දී නුසුදුස්සෙකු බවට ප්‍රකාශ කර තිබීමට එරෙහිව කරන ලද අභියාචනයක් තිබේද ? එසේ ලබා දී තිබේ නම් එය සලකා බලා පියවර ගෙන තිබේද ? පියවර ගෙන නොතිබේ නම් එයට හේතුව කුමක්ද යන්න විමසීමේ දී පිළිතුරු දක්වා ඇත්තේ එච්.ඩී.කේ. පෙරේරා මහතා විසින් 2023.05.29 දින නිලවරණ කමිටු සභාපති වෙත නිලවරණය පැවැත්වීම පිළිබඳ විරෝධතාවයක් ඉදිරිපත් කර ඇති බවත් එම විරෝධතාවය නිලවරණය පැවැත්වූ දිනයෙහිම ඉදිරිපත් කර ඇති බවත්ය.

මෙම පැමිණිලිකරු විසින් සභාපති ධූරය සඳහා අයදුම් කළ වර්ෂයේදී එවකට සිටි අමාත්‍යවරයා විසින් පත් කළ කමිටුවක් අදාළ කටයුතු සිදු කිරීමේදී සභාපති ධූරය සඳහා ගැසට්ගත කරන ලද සුදුසුකම් 22 හැර වෙනත් සුදුසුකමක් අවශ්‍ය වන බවට ලේඛනගත කර තිබේද? එසේ නම් ඊට හේතු සහ අමාත්‍යවරයා විසින් ඒ පිළිබඳ ගන්නා ලද පියවර කුමක්ද? යන්න විමසීමේදී දක්වා ඇත්තේ මේ පිළිබඳව ගැසට් නියෝගයක් මඟින් පල කළ යුතුව ඇති බැවින් අමාත්‍යවරයා විසින් සිදු කරනු ලබන නියමයන් අමාත්‍යාංශ මට්ටමින් තහවුරු කිරීම සුදුසු බවය.

සභාපති ධූරය සඳහා ගැසට්ගත සුදුසුකම් හැර වෙනත් සුදුසුකමක් හෝ සුදුසුකම් සලකා බලා කටයුතු කර තිබීම සම්බන්ධව එවකට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ගන්නා ලද පියවර හෝ අමාත්‍යවරයාට දන්වා යම් විමසීමක් සිදුකර තිබේද ? යන්න පිළිබඳවය විමසීමේදී පිළිතුරු ලබා දී ඇත්තේ 2023.05.29 වන දින නිලවරණය පවත්වා අවසන් කර නව නිලධාරී මණ්ඩලයක් පත්කර ඇති බවත් 2023.05.29 වන දිනැතිව එච්.ඩී.කේ. පෙරේරා මහතා විසින් නිලවරණ කමිටු සභාපති වෙත විරෝධතාවයක් ගොනු කර ඇති බවත් එහි පිටපතක් ක්‍රීඩා අමාත්‍යවරයා වෙතද යොමු කර ඇති බවයි. ඒ අනුව පවත්වා ගෙන යනු ලබන ලිපි ගොනුවලට අනුව එවකට අධ්‍යක්ෂ ජනරාල් වෙතින් විමසීමක් සිදු වී නොමැති බවයි.

<u>නිරීක්ෂණ</u>

- ශ්‍රී ලංකා ජිම්නාස්ටික් සංගමයේ 2024 වර්ෂයට අදාළව නිලධාරී මණ්ඩලය තොරා ගැනීමට අදාළව පැවති නිලවරණයේදී පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද නාම යෝජනාවට අදාළව ඔහු විසින් ශ්‍රී ලංකා ජිම්නාස්ටික් සංගමයේ සභාපති ධූරයට සුදුසුකම් සපුරා ඇති බවට සඳහන් කරමින් 2023.04.27 දිනැතිව ශ්‍රී ලංකා ජිම්නාස්ටික් සංගමයේ නිලවරණ කමිටු සභාපති හා කමිටු සාමාජිකයන් දෙදෙනෙකු ඇතුලුව නිලධාරීන් තිදෙනෙකුගේ අත්සනින් යුතුව ප්‍රකාශයට පත් කර ඇති බවත් එහි උදාර ලියන්වල යන අය විසින් සංගමයේ ලේකම් තනතුර සඳහා අංක 2215/47-2021 පෙබරවාරි 19 දින ගැසට් පත්‍රයට අනුකූලව සුදුසුකම් සපුරා නැති බව දක්වා ඇති බව නිරීක්ෂණය වේ. ගැසට් පත්‍රයට අනුකූලව ශ්‍රී ලංකා ජිමාස්ටික්

සංගමයේ ලේකම් ධූරයට සුදුසුකම් සපුරා නොමැති බව සඳහන්ව තිබියදී එම නිලවරණය සඳහා තරග කිරීම නීති විරෝධී ක්‍රියාවක් වන බව නිරීක්ෂණය වේ.

- නිලවරණ කමිටුව විසින් උදාර ලියන්වල යන අයගෙ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කර තිබියදී එය සුදුසුකම් ලද එකක් ලෙසට අභියාචනා උපදේශන කමිටුව විසින් භාර ගැනීම සිදු කිරීම නීති විරෝධි බවත්, එය ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලතල ප්‍රකාරව පත් කරන ලද නිලවරණ කමිටුවක් විසින් ගන්නා ලද තීරණයක් නොසලකා හරින ලද අවස්ථාවක් බවත්, මෙවැනි ක්‍රියා හේතුකොටගෙන අමාත්‍යතුමා හා අභියාචනා උපදේශන කමිටුව අපහසුතාවයට පත්කිරීම මෙන්ම වැරදි තොරතුරු ඉදිරිපත් කර නොමග යැවීමට යෝජනා කිරීමක්ද වන බවට විශ්‍රාමික දිසා විනිසුරු (කමිටු සභාපති) උපාලි සමරවීර මැතිතුමාගේ ශ්‍රී ලංකා ජිම්නාස්ටික් සංගමයේ 2023.06.21 දිනැති වාර්තාවේ කරුණු අංක 10 සහ 11 යටතේ පැහැදිලිව දක්වා ඇති අයුරු නිරීක්ෂණය වේ.

- ශ්‍රී ලංකා ජිම්නාස්ටික් සම්මේලන නිලවරණ කමිටුව විසින් නිලවරණ පැවැත්වීමේ ක්‍රියාවලිය පිළිබඳව ලබා දුන් කාල සටහන ප්‍රකාරව විරෝධතා දැක්වීමේ කාල සීමාව වශයෙන් 2023.04.19 දිනත් විරෝධතා පරීක්ෂා කර ලේඛන යොමු කිරීමේ දිනය ලෙස 2012.4.27 ලෙසත් පැහැදිලිව සඳහන්ව තිබියදීත් අභියාචනා උපදේශන කමිටුව විසින් උදාර ලියන්වල යන අය විසින් 2023.05.04 දින යොමු කර ඇති විරෝධතාවය 2023.05.10 දින බාර ගැනීම හෝ විරෝධතා දැක්වීම පරීක්ෂා කිරීම සම්පූර්ණව නීතියට පටහැනි ක්‍රියාවක් බව නිරීක්ෂණය වේ. එම නිලවරණ පැවැත්වීමේ ක්‍රියාවලිය පිළිබඳව නිකුත් කරන ලද කාල සටහන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

- පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකා ජිම්නාස්ටික් සංගමයේ සභාපති ධූරයට සුදුසුකම් සපුරා ඇති බවට නිලවරණ කමිටු තීරණය සම්බන්ධයෙන් 2023.05.17 වන දින අභියාචනා උපදේශන කමිටුව විසින් විභාග කරන ලද විරෝධතා පරීක්ෂණයේදී ඉදිරිපත් කරන ලද විරෝධතා පිළිගනිමින් නිලවරණයට ඉදිරිපත් වීමට පැමිණිලිකරු නුසුදුසු කෙනෙකුවන බව දක්වා තිබීම මත එම තීන්දුව නීති විරෝධී තීන්දුවක් බැවින් සාධාරණ අපක්ෂපාතී අභියාචන පරීක්ෂණයක් සිදු කරන ලෙසත් එතෙක් 2023.05.29 දින පැවැත්වීමට නියමිත නිලවරණය කල් තැබීමට කටයුතු කර එම පරීක්ෂණ තීන්දුවෙන් පසුව නිලවරණය පවත්වන ලෙසත් ලිඛිතව ඉල්ලීමක් 2023.05.25 දිනැතිව සිදු කර ඇති බව නිරීක්ෂණය වේ. තවද නිලවරණය පවත්වන ලද 2023.05.29 වන දින සෙසු පිරිස සමඟ "ඩන්කන් වයිට්" සම්මන්ත්‍රණ ශාලාවේ පැවති නිලවරණ කමිටුවට පැමිණිලිකරුද ඉදිරිපත් වුවද තමා හට ඡන්දයට ඉදිරිපත් වීමට අවස්ථාව නොදීම පිළිබඳව නිලවරණ කමිටුව වෙත ලිඛිතව විරෝධතාවයක් පළකර ලිපියක් එදිනම බාර දී ඇති අයුරු නිරීක්ෂණය වේ. නමුත් කොමිෂන් සභාව හමුවේ 2025.02.05 දින පැවති පරීක්ෂණ අවස්ථාවෙහි 1වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර සිටින ලද්දේ එවැනි අභියාචනයක් සිදු කර නොමැති බවය. නමුත් මෙම කොමිෂන් සභාවේ 2025.04.04 දිනැති ලිපියට පිළිතුරු දක්වමින් ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් විසින් කොමිෂන් සභාව වෙත දන්වා ඇත්තේ එච්.ඩී.කේ. පෙරේරා මහතා විසින් 2023.05.29 දින නිලවරණ කමිටු සභාපති වෙත නිලවරණය පැවැත්වීම පිළිබඳ විරෝධතාවයක් ඉදිරිපත් කර ඇති බවත් එම විරෝධතාවය නිලවරණය පැවැත්වූ දිනයෙහිම ඉදිරිපත් කර ඇති බවත්ය.

- 1974 අංක 25 දරන ක්‍රීඩා පනතට අදාළව නිකුත් කර ඇති 1990/23/2016 ඔක්තෝබර් 27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ 4 වගන්තිය යටතේ ක්‍රීඩා සංගමයක තනතුරු සඳහා ඉල්ලීමට නුසුදුස්සෙකු වන කරුණු විසි දෙකක් පැහැදිලිව සඳහන් කර ඇති අතර එහි සඳහන් කිසිදු කරුණකට අදාළ නොවෙන කරුණක් පිළිබඳව මෙම අභියාචන උපදේශන කමිටුව විසින් පැමිණිලිකරු වෙත චෝදනා එල්ල කර ඇති බව නිරීක්ෂණය වේ. පැමිණිලිකරුට විරුද්ධව එල්ල වූ චෝදනාවක් වූයේ වර්ෂ 2017/2019 වර්ෂයේ ජාතික ජිම්නාස්ටික් සංගමයේ සභාපතිව සිටිමින් ස්ථාවර වත්කම් නැවත භාරදී නැත යන්නයි. නමුත් මෙම කොමිෂන් සභාවේ 2025.04.04 දිනැති ලිපියට පිළිතුරු දක්වමින් ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් විසින් කොමිෂන් සභාව වෙත දන්වා ඇත්තේ මේ වන විට අදාළ භාණ්ඩ හා උපකරණ සංගමය සන්තකයේ පවතින බවත් අදාළ භාණ්ඩ හා උපකරණ 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ 3.2 හි (ඊ) කොටසේ සංගමය සතු ස්ථාවර වත්කම් යටතේ දක්වා ඇති බවත් තවදුරටත් පැමිණිලිකරු විසින් භාරදිය යුතු භාණ්ඩ හා උපකරණ ඔහු සන්තකයේ නොමැති බවටත්ය. නමුත් මෙම කොමිෂන් සභාවේ විමසීම පරිදි ජාතික ජිම්නාස්ටික් සංගමයේ ලේකම් විසින් ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් අමතා ඇති 2024.11.08 දිනැති ලිපියෙහි අනු අංක 5 යටතේ දක්වා තිබුණේ 2020 ජනවාරි නිල කාල සීමාව නිම කරනු ලබන එච්.ඩී.කේ.එස්. පෙරේරා මහතා 2023 මාර්තු 10 පවත්වන නව ලේකම් කපිල ජීවන්ත මහතාට 2023.09.08 දින ලේඛන භාරදීම/ ස්ථාවර වත්කම් බාර දී නැත යනුවෙන්ය. මේ අනුව අවස්ථා දෙකකදී පරස්පර විරෝධී තොරතුරු ඉදිරිපත් කර ඇති ආකාරයක්ද නිරීක්ෂණය වේ.

**නිගමනය**

2017/2019 වර්ෂයේ ජාතික ජිම්නාස්ටික් සංගමයේ හිටපු සභාපති වශයෙන් පැමිණිලිකාර එච්.ඩී.කේ.එස්.පෙරේරා මහතා ස්ථාවර වත්කම් බාර නොදුන් බවට තීරණය කරමින් 2023.05.29 දින පැවති ජාතික ජිම්නාස්ටික් සංගමයේ නිලවරණය සඳහා ඉදිරිපත් වීමට අවස්ථාව ලබා දී නොතිබීමෙන් හා එම අදාළ භාණ්ඩ හා උපකරණ ජාතික ජිම්නාස්ටික් සංගමය සන්තකයේ පවතිද්දී එම භාණ්ඩ ලැබී නොමැති බව දිගින් දිගටම ප්‍රකාශ කිරීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කොට ඇති නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුතු බවට වූ පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම 1වන, 2වන සහ 3වන වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය**

1. වගඋත්තරකරුවන් විසින් එක්ව හා හෝ වෙන් වෙන්ව විධායක හා පරිපාලන වශයෙන් ක්‍රියාකර ඇති ආකාරය අනුව පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බව මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2. ක්‍රීඩා පනතේ හෝ ක්‍රීඩා පනතට සමගාමීව ප්‍රකාශිත ගැසට් පත්‍රයක සඳහන්ව නොමැති චෝදනාවක් සම්බන්ධයෙන් පැමිණිලිකරුහට අසත්‍ය චෝදනා එල්ල කරමින් ශ්‍රී ලංකා ජිම්නාස්ටික් සංගමයේ නිලවරණයට ඉදිරිපත් වීමට තිබූ අවස්ථාව අහිමි කිරීම හා අහිමි කර තිබීම මත පැමිණිලිකරු දිගින් දිගටම මූලික අයිතිවාසිකම් උල්ලංඝනයවීමකට ලක්වීම

වැළැක්වීම සඳහා මීලග නිලවරණයට ඉදිරිපත්වීමට ඔහුට තවදුරටත් බාධාවක් නොමැති බවට ලිඛිතව දැන්වීමක් කඩිනමින් පැමිණිලිකරු වෙත යැවීමට ක්‍රියා කළ යුතු බවට වගඋත්තරකාර ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ වත්මන් ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත මෙයින් නියම කර සිටිමු.

3. පැමිණිලිකරුගේ අයිතිවාසිකම් උල්ලංඝනය වන අයුරින් කටයුතු කර ඇති නිලධාරීන් සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් සිදුකර විනය පියවර ගෙන ඒ පිලිබඳව මෙම කොමිෂන් සභාව වෙත වාර්තා කරන ලෙසට ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත මෙයින් නියම කර සිටිමු.

2025.09.11 වන දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී .පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් :- 01. අමාත්‍යතුමා, - කරුණු දැනගැනීම සඳහා
තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය
නො.09,
පිලිප් ගුණවර්ධන මාවත
කොළඹ 07

02. අධ්‍යක්ෂ ජනරාල් - අදාළ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව
නො 09, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07